**ඔපෙක් අරමුදලින් මූල්‍යයනය කරන කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2023**

---

ඔපෙක් අරමුදලින් මූල්‍යයනය කරන කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, නාවික කටයුතු හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ජාතික මාර්ග 13ක කිලෝමීටර් 65.45ක් වැඩිදියුණුකිරීම හා නාරාහේන්පිට- නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 11,212.37කට සමාන එ.ජ.ඩො. මිලියන 86.25ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57කට සමාන එ.ජ.ඩො.මිලියන 50ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2026 මැයි 12 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශයය |
|---|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල අංක 03 සටහනට අනුව, කොට්ටාව, තලගල මාර්ගයේ ඉදිකිරීම් අවසන් කර 2022 ජනවාරි 12 වන දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. කෙසේ වෙතත්, එම වටිනාකම සිවිල් වැඩවලට මාරු කර නොතිබූ අතර කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් සිවිල් වැඩ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 1,630.69 | අවසන් කරන ලද වැඩවල වටිනාකම ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල සිවිල් වැඩ යටතේ සටහන් කෙරේ. | ගණකාධිකාරීවරයා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂයේදී මිලදී ගත් ජංගම නොවන වත්කම් අදාළ වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගැනීම් ලෙස සලකා ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. | 0.633 | ව්‍යාපෘතිය එම වත්කම් මිලදී ගැනීම් ලෙස සළකා නොමැති අතර සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගැනීම් ලෙස ගිණුම්ගත කර නොමැත. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා කෙටුම්පත් වාර්තාවේ උපදෙස් පරිදි මෙම ගැලපීම දෝෂ නිවැරදි කිරීමක් වේ. කාර්යාල මේස දෙකක සහ එක් ඩෙස්ක්ටොප් පරිගණකයක වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ නැවත වර්ග කර ඇත.<br>මෙම වත්කම් 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර ඇති අතර, ඒවා 2023.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් කර ඇත. | ගණකාධිකාරීවරයා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය සඳහා ගෙවිය යුතු වන්දි සහ පොලී සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවලට අනුව, මාර්ග 3 ක් සඳහා ගෙවිය යුතු වන්දි මුදල රු. මිලියන 139.86 කි. කෙසේ වෙතත්, 2024 වසරේ මුල් මාස දෙක තුළ පමණක් පෙර වසර සඳහා රු. මිලියන 202.31 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. එබැවින් රු. මිලියන 62.45 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, 2024 වසරේ මුල් මාස දෙක සඳහා පමණක් රු. මිලියන 19.07 ක වටිනාකමක් සහිත වවුචර්පත් 34 ක් ගෙවීමට ඉදිරිපත් කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වන්දි ප්‍රමාණය අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | 81.52 | 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් 2023.12.31 වන විට වවුචර සම්පූර්ණයෙන්ම අවසන් කර නොතිබූ බැවින් ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයට අදාළ සියලුම වන්දි හා පොලී නිසි පරිදි හඳුනා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් ඉදිරියේදී වන්දි සහ පොලී සඳහා නිවැරදිව ප්‍රතිපාදන වෙන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන බවට සහතික විය යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව, ව්‍යාපෘතියට එරෙහි අධිකරණ නඩු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | - | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘතියට එරෙහි අධිකරණ නඩු හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන බවට සහතික විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාද සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | | |
| | | ප්‍රතිශතය | ප්‍රතිශතය | | |
| ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය | මාර්ග ඉදි කිරීම් | | | අදාළ මාර්ගවල සත්‍ය ප්‍රගතිය සැලසුම් කළ ප්‍රගතියට වඩා අඩුවෙන් පැවතුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, උපයෝගිතා සේවාවන් මාරු කිරීමේ ප්‍රමාදය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය. |
| (අදියර-01) | | 100 | 98 | | |
| (අදියර-02) | | 100 | 94 | | |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

ප්‍රධාන වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල නල එලීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද විය. තවද, මූලික උපයෝගිතා සේවාවන් මාරු කිරීමේ ප්‍රමාදයන් ද ප්‍රගතියට බලපාන ලදී.

**විගණකගේ නිර්දේශය**

වැඩසටහන කාලානුරූපීයව සංශෝධනය විය යුතු අතර PMU විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු අතර අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට පියවර ගත යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 96.76 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර නොගෙන 2023 දෙසැම්බර් 31 දිනට ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ (අදියර II) කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 83.6 ක රඳවා ගැනීමේ මුදල් නිදහස් කර තිබුණි. ඒ අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය අයකර නොගෙන සම්පූර්ණ රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට අදාළ හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි. තවද, එම කොන්ත්‍රාත්කරු විසින් සිදු කරන ලද මාර්ග වැඩ 2024 මාර්තු මාසය දක්වාවත් නිම කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, අත්තිකාරම් ගෙවීම් බැඳුම්කරයේ වලංගු කාලය 2024 අප්‍රේල් 30 දිනෙන් අවසන් වන බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br><br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව වලංගු බැංකු ඇපකරයකට එරෙහිව රඳවා ගැනීමේ මුදල් නිදහස් කර ඇත. අත්තිකාරම් ගෙවීම් ආපසු අයකර ගැනීම කොන්ත්‍රාත් ගිවිසුමේ දක්වා ඇති සූත්‍රයට අනුව සිදු කරනු ලබන අතර ඉහත ක්‍රියාකාරකම් දෙක අතර කිසිදු සම්බන්ධයක් නොමැත. 2024.02.29 දිනට අයකර ගත යුතු ඉතිරි අත්තිකාරම් මුදල රු. මිලියන 58.3 කි.<br><br>ජල කාන්දුවීම් හේතුවෙන් මාර්ගයේ වැඩ අවසන් කර නොමැති අතර එක් නලයක් වැල්ලම්පිටිය හන්දිය දක්වා ක්‍රියාත්මක වන අතර වැල්ලම්පිටියෙන් ඔබ්බට (ඔරුගොඩවත්ත කෙළවර) නල 03ක් ක්‍රියාත්මක වේ.<br><br>අත්තිකාරම් ගෙවීම් බැඳුම්කරයේ වලංගු කාලය කොන්ත්‍රාත්කරු (M/s. Tudawe Brothers (Pvt) Ltd) විසින් 2024.03.28 දින දීර්ඝ කරන ලදී. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට පෙර වැඩවල සම්පූර්ණත්වය සහතික කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල (FIDIC-1999) අංක 4.2 වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු තමාගේම වියදමින් කාර්යසාධන සුරක්ෂණය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කාර්යසාධන සුරක්ෂණ පිරිවැය සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 7.39 ක මුදලක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවල (COC) 4.2 වගන්තියට අනුව, ටෙන්ඩරයේ උපග්‍රන්ථයේ (Appendix to the Tender) වටිනාකම සහ මුදල් වර්ගය දක්වා ඇත්නම් කොන්ත්‍රාත්කරු තම වියදමින් කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගත යුතු බව පැහැදිලිව සඳහන් කර ඇත. කෙසේ වෙතත්, ඔරුගොඩවත්ත - අඹතලේ අදියර I සඳහා පළ කරන ලද ටෙන්ඩර් ලේඛනවල එම වටිනාකම සඳහන් කර නොමැත. එවැනි අවස්ථාවක Appendix to the Tender හි වටිනාකම සඳහන් කර නොමැති නම් මෙම 4.2 වගන්තිය අදාළ නොවන බව එම වගන්තියේ තවදුරටත් සඳහන් කර ඇත. එබැවින්, කාර්යසාධන සුරක්ෂණය සඳහා ගෙවීම් අයිතමයක් ලබා දී ඇත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ලංසු ලේඛන ඇගයීමේදී මෙම කරුණු සලකා බැලීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත දැනුම් දිය යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවිතරවල 128 සහ 129 උප වගන්තිවලට අනුව, පවරා ගැනීමේ සහතිකය නිකුත් කරන දිනයේදී රසායනාගාරය, උපකරණ සහ ගෘහ භාණ්ඩ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතු අතර කොන්ත්‍රාත්තුව අවසානයේ මැනුම් උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දිනට ක්ෂේත්‍ර රසායනාගාර උපකරණ සහ මිනුම් උපකරණ සඳහා රු.මිලියන 15.66 ක මුදලක් එකවර ගෙවීම් කර තිබුණි. අවාසිදායක කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අමතර ප්‍රතිලාභ අත්කර දීමට හේතු විය හැකි බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br><br>මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) පවතින රසායනාගාර සහ මැනුම් උපකරණ අවශ්‍යතාවයන් ඉක්මවා යන අතර, ව්‍යාපෘතියේ නිගමනය අනුව නව උපකරණ ලබා ගැනීම අනවශ්‍ය වේ. එබැවින්, සේවා යෝජකයාගේ අපේක්ෂාවන්ට අනුකූල වීම සඳහා විශේෂිත පිරිවිතර 128 සහ 129 වගන්ති (සේවා යෝජකයාගේ අවශ්‍යතා) කොන්ත්‍රාත්තුවට ඇතුළත් කර ඇත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ලංසු ලේඛන ඇගයීමේදී මෙම කරුණු සලකා බැලීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත දැනුම් දිය යුතුය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට සේවායෝජකයා/ඉංජිනේරු වෙනුවෙන් කාර්යාල සහ නිවස සඳහා එකවර රු. මිලියන 36.56 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. තවද ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු. මිලියන 8.36 ක මුදලක් වැඩියෙන් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ ලංසු අනුපාතය ගෘහ භාණ්ඩ හා උපකරණවල ක්ෂයවීම් අගය මත පදනම් වේ. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසානයේ ගෘහ භාණ්ඩ සහ උපකරණ සේවායෝජකයාගේ දේපළ බවට පත් වන පරිදි අනාගත කොන්ත්‍රාත්තුවල ලංසු පිරිවිතරයන් වෙනස් කිරීමට සටහන් කර ගෙන ඇත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ලංසු ලේඛන ඇගයීමේදී මෙම කරුණු සලකා බැලීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත දැනුම් දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2023 දෙසැම්බර් 31 අවසානයේ අවසාන අන්තර් ගෙවීම් සහතිකය අනුව ව්‍යාපෘතිය විසින් නිසි අනුමැතියකින් තොරව ප්‍රමාණ පත්‍රවලට (BOQ) වඩා රු. මිලියන 144.4 ක් වැඩියෙන් ගෙවා තිබුණි. මූලික සහ සාමාන්‍ය අයිතමවල පිරිවැය කොන්ත්‍රාත්තුවට අමතර පිරිවැයක් දැරීමට සිදු වන පරිදි එම වටිනාකමින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මාර්ග කටයුතුවලට සමගාමීව ව්‍යාපෘති මාර්ගය ඔස්සේ නව නළ එලීමේ කටයුතු ආරම්භ කර ඇත. නල එලීමේ කටයුතු ප්‍රමාද වූ අතර මාර්ග වැඩ ද ප්‍රමාද විය. එබැවින් මූලික සහ සාමාන්‍ය අයිතම සඳහා ගෙවීම් ඒ අනුව ඉක්මවා ගොස් තිබුණි. | වැඩසටහන කාලානුරූපීයව සංශෝධනය විය යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු අතර අනවශ්‍ය වියදම් වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ සිවිල් වැඩ සඳහා පැකේජ දෙකක් වෙනුවෙන් ප්‍රමාණ පත්‍ර (BOQ) ප්‍රකාරව ගෙවීම් අයිතම 221 ක් සඳහා රු.මිලියන 607.36 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, ව්‍යාපෘතිය අවසානයේ 2023 දෙසැම්බර් මාසය සඳහා ගෙවන ලද අන්තර් ගෙවීම් සහතිකය දක්වා කිසිදු ගෙවීමක් එම අයිතම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් සිදු කර නොතිබුණි. එබැවින් මෙම ගෙවීම් අයිතමයන් ඇස්තමේන්තු කිරීම විගණනයේදී ගැටළුසහගත කරුණක් විය. | වැඩ අයිතම 107 ක් අතරින් සමහර අයිතම තවමත් සම්පූර්ණ කර නොමැත. තවද සමහර වැඩ අයිතම වැඩ බිමේ තත්ත්වය සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුමෙන් ඉවත් කරන ලදී. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් BOQ අනුමත කිරීමට පෙර අනවශ්‍ය BOQ අයිතම වළක්වා ගැනීම සම්බන්ධයෙන් සහතික විය යුතුය. |
| (උ) | මාර්ග සැලැස්මට අනුව ගෙවීම් අයිතම සඳහා ප්‍රමාණයන් ඉංජිනේරුවරයා විසින් නිසි ලෙස මනිනු ලැබ ඇති අතර, ඒ අනුව BOQ හි ඇතුළත් ප්‍රමාණයන් කොන්ත්‍රාත් ගිවිසුමේදී කොන්ත්‍රාත්කරු සමඟ එකඟ වී ඇත. ඊට පටහැනිව, නිසි අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරුට අමතර ප්‍රමාණයන් සඳහා රු.මිලියන 194.6 ක් ගෙවා තිබුණි. මෙය විගණනයේදී ප්‍රශ්නසහගත වන අතර මෙම අතිරේක පිරිවැය කොන්ත්‍රාත් මුදල වැඩි වීමට බලපාන බව නිරීක්ෂණය විය. | වැඩ බිමේ තත්ත්වය අනුව ඉංජිනේරුවරුන්ගේ නිර්දේශ මත BOQ මගින් සපයා ඇති ප්‍රමාණයන් වැඩි කර ඇති අතර ඒ අනුව BOQ සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් BOQ අනුමත කිරීමට පෙර අනවශ්‍ය BOQ අයිතම වළක්වා ගැනීම සම්බන්ධයෙන් සහතික විය යුතුය. |
| (ඌ) | මාර්ගයේ සැලසුමට අනුව ඉංජිනේරුවරයා විසින් නිසි මිනුම් සහිතව ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කර තිබුණද ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට විචලතා නියෝග වෙනුවෙන් රු. මිලියන 208ක ගෙවීම් කර තිබුණි. මෙම විචලනයන් 2024 මාර්තු 31 දින දක්වා අනුමත කර නොතිබූ අතර එය විගණනයේදී ගැටළුසහගත කරුණක් විය. | අයිතම (vi) සහ (vii) හි විස්තර කර ඇති පරිදි, වැඩ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණයන් සහ නව වැඩ අයිතම ඇතුළත් කර ඇති අතර, ඉංජිනේරුවරයාගේ නිර්දේශය අනුව විචලතා නියෝග නිකුත් කරනු ලබයි. සේවා යෝජකයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | වැඩසටහන කාලානුරූපීයව සංශෝධනය විය යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | අවසාන උපදේශක වාර්තාවට අනුව, සංසනීකරණ පරීක්ෂණ (compaction tests) 280 ක් අසමත් වී ඇති අතර ඇස්පෝල්ට් කොන්ක්‍රීට් 6 ක් (ඝනකම සහ ඝනත්වය) ද අසාර්ථක වී තිබුණි. ඒ අනුව සංසනීකරණ නැවත පරීක්ෂණ 272ක් සිදු කර ඇති අතර එහි ප්‍රතිඵල උපදේශක වාර්තාවේ සඳහන් කර නොතිබුණි. එබැවින් මාර්ගයේ තත්ත්ව සහතිකය විගණනයේදී ගැටළුසහගත විය. | අසාර්ථක වූ සංසනීකරණ පරීක්ෂණ නැවත සිදු කර අවශ්‍යතාවලට අනුකූල කර ඇත. ඉංජිනේරුවරයාගේ පැහැදිලි කිරීම අනුව, ඇස්පෝල්ට් කොන්ක්‍රීට් සඳහා පරීක්ෂණ 6ක වායු ශූන්‍යතා අගය (Air void ration) පිරිවිතරයෙන් සුළු වශයෙන් අපගමනය වන අතර පසුගිය වසර දෙක තුළ අධීක්ෂණය කරන ලද අතර මාර්ග මතුපිට සඳහා අහිතකර බලපෑමක් සිදුකර නොමැත. | ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේදී ඉංජිනේරුවන් විසින් ලොග් සටහන් තබා ගත යුතු අතර ඒ අනුව ගෙවීම් අඩු කළ යුතුය. |
| (ඒ) | කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතියේ ණය ගිවිසුම 2013 ජුනි 10 වැනි දින ඇ.ඩො. මිලියන 50කට අත්සන් කරන ලද අතර 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් අරමුදල් සපයන ආයතනය විසින් ණය ගිවිසුමේ අවසන් දිනය 2024 පෙබරවාරි 29 දක්වා කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි.<br><br>ණය වලංගු කාලය 2026 මැයි 12 දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී තිබුණද, විගණන දිනය වන 2024 මාර්තු 25 වන දින දක්වා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි. | එකඟ වේ.<br><br>ණය කාලය දීර්ඝ කිරීම ලබා ගැනීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් 2024.03.29 දින අනුමැතිය ලැබී ඇත. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඔ) | ව්‍යාපෘතියේ වැඩ විෂයපථයට කොන්ත්‍රාත් පැකේජ 06 ක් යටතේ ක්‍රියාත්මක කරන ලද කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග 12 ක කිලෝමීටර් 63.72 ක් සහ නාරාහේන්පිට - නුගේගොඩ මාර්ගයේ අංක 2/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සමන්විත විය. ව්‍යාපෘතියේ කටයුතු 2013 දෙසැම්බර් 11 වන දින ආරම්භ කර 2017 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණද, ජාතික මාර්ග 06 ක ප්‍රතිසංස්කරණ කටයුතු සහ පාලමේ වැඩිදියුණු කිරීම් පමණක් 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කර තිබුණි. මෙම මාර්ගයට සම්බන්ධ කර තිබූ පංචසාර මාවත නම් මාර්ගය කිසිදු අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්තුවේ විචලතාවයක් යටතේ ප්‍රතිසංස්කරණය කර තිබුණි. මෙම ඉදිකිරීමේ වියදම රු. මිලියන 30.85 ක් වූ අතර, මෙය ව්‍යාපෘතියේ අරමුණුවලින් බැහැර වූවක් බව නිරීක්ෂණය විය. රු. මිලියන 30.85 ක මෙම විචලතා නියෝගය | එකඟ නොවේ.<br><br>පංචසාර මාවත වැඩිදියුණු කිරීම, අමාත්‍යාංශ ලේකම් (MOH&H) විසින් 2022.12.29 දින ප්‍රතිපත්තිමය වශයෙන් අනුමත කරන ලදී.<br><br>මහරගම - පිළියන්දල පාර<br><br>විශ්වවිද්‍යාල 03ක විශේෂඥ දැනුමෙන් සමන්විත විශේෂඥ කමිටුවක් මගින් ලංසු ඇගැයීම නැවත සලකා බලන ලෙස අධිකරණය විසින් නියෝග කර ඇති අතර කමිටු වාර්තාව අධිකරණයට ඉදිරිපත් කර ඇත. | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ව්‍යාපෘතියේ විෂය පථයට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2022 දෙසැම්බර් 19 වන දින මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර 2024 මාර්තු 31 දින දක්වා අනුමැතිය ලැබී නොතිබුණි. | | |
| (ඕ) | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගයේ අදියර I ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව 2017 ජූලි 01 දින රු.මිලියන 1,528 ක පිරිවැයකට ආරම්භ කර 2019 ජුනි 30 දින නිම කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය නොසලකා කොන්ත්‍රාත් කාලය 2023 අගෝස්තු 28 දක්වා 10 වතාවක් දීර්ඝ කර තිබුණි. අවසාන ප්‍රගති වාර්තාවට අනුව, 2023 මාර්තු 31 න් පසු කාලය දීර්ඝ කිරීම් (EOT) සඳහා ඉල්ලීම් කර නොතිබුණි.<br><br>ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගයේ අදියර II ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් 21 දින රු.මිලියන 1,943 ක පිරිවැයකට ආරම්භ කර 2021 ඔක්තෝබර් 20 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් කාලය 2023 සැප්තැම්බර් 09 දක්වා 04 වතාවක් දීර්ඝ කර තිබුණි. අවසන් ප්‍රගති වාර්තාවට අනුව, රු. මිලියන 55.25ක වටිනාකමකින් යුත් අතුරු හිමිකම් පෑම් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණි. හිමිකම් පෑම ඇගයීමට ලක් වෙමින් පැවති බවත්, 2022 දෙසැම්බර් 31 දිනට පසුව EOT සඳහා ඉල්ලීම් කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. එය විගණනයේදී ගැටළුසහගත කරුණක් විය. කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 8.7 අනුව, කොන්ත්‍රාත් ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද කළ හානි (LD) අය කළ යුතුය. අදියර I සහ II පිළිවෙලින් දින 125කින් සහ දින 113කින් ප්‍රමාද වී තිබුණද, ව්‍යාපෘතිය මගින් රු. මිලියන 347.19ක ප්‍රමාද කළ හානි සඳහා අය කර නොතිබුණි. එම තත්ත්වයට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වගකිව යුතු වේ. | <u>ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය - අදියර I</u><br><br>ප්‍රධාන වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල නල එලීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද විය. තවද, මූලික උපයෝගිතා සේවාවන් මාරු කිරීමේ ප්‍රමාදයන් ද ප්‍රගතියට බලපාන ලදී.<br><br>එබැවින් කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධනය ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් ප්‍රමාදයට බල නොපාන ලදී.<br><br><u>ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය - අදියර II</u><br><br>EOT සඳහා ඉල්ලීම අනුමැතිය සඳහා RDA වෙත ඉදිරිපත් කරන ලදී.<br><br>ඉහත පැහැදිලි කර ඇති පරිදි, ව්‍යාපෘති ප්‍රමාදය සඳහා කොන්ත්‍රාත්කරු සම්පූර්ණයෙන් වගකීමට භාජනය කළ නොහැකි අතර ඒ අනුව LD අයදූම් කළ නොහැක. | වැඩසටහන කාලානුරූපීයව සංශෝධනය විය යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | ICTAD - 2009 විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ග සහ පාලම් ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා වූ සම්මත පිරිවිතරයන්ට පටහැනිව, ඉහත ප්‍රසම්පාදනය සඳහා අතිරේක වශයෙන් රු. මිලියන 83.3 ක ගෙවීම් අයිතම හයක් ඉංජිනේරු ඇස්තමේන්තුවට එකතු කර තිබුණි. | ICTAD - 2009 විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ග සහ පාලම් ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා වන සම්මත පිරිවිතර සියලු ඉදිකිරීම් ක්‍රියාකාරකම් ආවරණය නොකරන අතර වැඩ බිමේ තත්ත්වය අනුව අමතර අයිතම එකතු කරනු ලැබේ. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අමතර සේවක අවශ්‍යතා සහ නැවත කැඳවීමේ අවශ්‍යතාවය පිළිබඳ සහතික විය යුතු අතර හේතු සටහන් කළ යුතුය. |

## 3.3 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අංක 4.1(6) වගන්තිය | ප්‍රසම්පාදන සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර නොතිබූ අතර විදේශ ණය දෙන නියෝජිතායතනය විසින් අනුඥාත කර නොතිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබූ බවද නිරීක්ෂණය විය. | මෙම කරුණු පිළිපැදීමට ක්‍රියා කරන ලෙස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අංක 7.9.2 වගන්තිය | ඇගයීමේදී සාරානුකූලව ප්‍රතිචාර දැක්වූ වූ අඩුම ලංසුව සැලකිය යුතු ආන්තිකයකින් ඉංජිනේරු ඇස්තමේන්තු ඉක්මවන්නේ නම්, ප්‍රසම්පාදන ආයතනය නව ලංසු සලකා බැලිය යුතු අතර එසේ නැතහොත් සතුටුදායක කොන්ත්‍රාත්තුවක් ලබා ගැනීමට උත්සාහ කිරීම සඳහා අඩුම ලංසුකරු සමඟ සාකච්ඡා කළ හැකිය.<br>ඉංජිනේරු ඇස්තමේන්තුව 63% ඉක්මවන රු. මිලියන 794.49 ක වටිනාකමකින් යුත් මහරගම පිළියන්දල මාර්ගය (I කොටස) ඉදිකිරීම ඉහත ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව ප්‍රදානය කර තිබුණි. | ඉහත ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව 2021 වර්ෂයේ HSR අනුපාත මත පදනම්ව සකස් කර ඇත. | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පෙන්වා දී ඇති කරුණු අනුව මිල ඉහළ යෑම් ගණනය කරනු ලබන බව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහතික කළ යුතුය. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අංක 2.6.1 වගන්තිය | තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා පූර්ව ලංසු රැස්වීමට සහභාගී වී නොතිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) සාමාජිකයෙකු ලෙස එක් ඉංජිනේරුවරයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයාගේ නියෝජිතයා ලෙස පූර්ව ලංසු රැස්වීමට සහභාගී විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අංක 2.12 වගන්තිය | ඉහත තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු එහි පළමු රැස්වීමේදී ප්‍රකාශ පත්‍රයට අත්සන් කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

### 3.4 ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ලැබී ඇති තොරතුරුවලට අනුව, ව්‍යාපෘති කටයුතු සඳහා රජයේ ඉඩම් කට්ටි 992 ක් ඇතුළුව ඉඩම් කට්ටි 5,710 ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් ඉඩම් කට්ටි 4,683 ක් සඳහා රු. මිලියන 2,658 ක ප්‍රමාද පොලී ඇතුලුව වන්දි මුදල් රු. මිලියන 12,176 ක් ව්‍යාපෘතිය මගින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් කට්ටි 05 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. තවද, එය ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑ හැකිය. | අත්පත් කර ගත යුතු මුළු ඉඩම් කට්ටි ප්‍රමාණය 5666 ක් වන අතර එයට රජයේ ඉඩම් කට්ටි 992 ක් ඇතුළත් වේ. කෙසේ වෙතත්, 2023.12.31 දිනට ඉඩම් කැබලි 361ක් 44 වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇත.<br><br>වන්දි ගෙවීමෙන් පසු ඉඩම්වල හිමිකම ලබාගෙන ඉදිකිරීම් සිදු කරගෙන යා හැක. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් ලියාපදිංචි කිරීම, වන්දි ගෙවීමෙන් පසුව ආරම්භ විය.<br><br>එබැවින්, ව්‍යාපෘති කාර්යසාධනය සඳහා 44 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම බල නොපායි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහිතව සිදු කළ යුතුය. |

### 3.5 මතභේදයට තුඩු දෙන කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| අමතර පිරිවැය ගෙවීම සඳහා ණය ප්‍රතිපාදන ඉතිරිව නොමැති බැවින්, සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු GOSL අරමුදල්වලින් 2023 මැයි 12 දින දීර්ඝ කිරීමේ පිරිවැය (Prolongation Cost) ලෙස රු. මිලියන 24.24 ක මුදලක් ගෙවා තිබුණි. මුල්‍ය ප්‍රකාශනවල අංක 01 සටහනට අනුව රජයේ අරමුදලින් වන්දි හා පොලී පමණක් ගෙවිය යුතු වුවද ඊට පටහැනිව රජයේ අරමුදල්වලින් ලැබුණු රු. මිලියන 24.24 ක මුදලක් නිසි අනුමැතියකින් තොරව ඉදිකිරීම් වියදම් නිරවුල් කිරීම සඳහා භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. | රජයේ මුදල් වන්දි සහ පොලී ගෙවීමට පමණක් ලබා දී ඇති බව බව වැරදීමකින් සඳහන් කර ඇත. GOSL අරමුදල් වැය විෂය අංක දෙකක් යටතේ වෙන් කරනු ලැබේ: 117-2-4-32-2105 (17) යටතේ සපයනු ලබන අරමුදල් වන්දි සහ පොලී ගෙවීම් සඳහා නම් කර ඇති අතර, 117-2-4-32-2506 (17) යටතේ ලබා දෙන අරමුදල් විදේශ ආධාර ආශ්‍රිත දේශීය අරමුදල් යටතේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වියදම් සහ ඉදිකිරීම් පිරිවැය ආවරණය කිරීම අපේක්ෂා කෙරේ.<br><br>තවද, දීර්ඝ කිරීමේ පිරිවැය ගෙවීම සඳහා කැමැත්ත ලබා දී ඇත. | මුල්‍ය ප්‍රකාශන සඳහා ගණකාධිකාරීවරයා වගකිව යුතුය. |

## 3.6 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| පිළියන්දල මහරගම මාර්ගයේ සම්පූර්ණ දිග කිලෝමීටර් 5.8 ක් වන අතර වැඩිදියුණු කිරීම මාර්ග කොටස් තුනකට සැලසුම් කර ඇත. කිලෝමීටර් 1.8 ක දිගකින් යුත් පළමු මාර්ග කොටස 2023 දෙසැම්බර් 07 දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් ප්‍රදානයට එරෙහිව ලංසුකරුවෙකු විසින් අධිකරණයට ගොනු කර ඇති නඩුවක් හේතුවෙන් වැඩ තාවකාලිකව අත්හිටුවා තිබුණි. එය ව්‍යාපෘති කාර්යසාධනයට දැඩි ලෙස බලපා තිබුණි. | මහරගම - පිළියන්දල මාර්ගය ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්තු 03ක් යටතේ ක්‍රියාත්මක කරන ලදී. LAQ වැඩ සම්පූර්ණයෙන්ම අවසන් වන තුරු ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකිරීමට තීරණය කර ඇත. මාර්ගයේ I කොටස (0+000 km සිට 1+800km) ඉදිකිරීම සඳහා ප්‍රදානය කර ඇති අතර එක් ලංසුකරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද FR සම්බන්ධ නඩුවක් හේතුවෙන් වැඩ තාවකාලිකව අත්හිටුවන ලදී. | ප්‍රමාදය සහ පිරිවැය අවම කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.7 නිෂ්ක්‍රීය/ අක්‍රීය/ ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණය සහ GOSL සංරචකය යටතේ පිළිවෙලින් රු. මිලියන 900 ක් සහ රු.මිලියන 75 ක් (වැය විෂය අංක 117-2-4-32-2506-0/17) යටතේ වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල දුර්වල ප්‍රගතිය හේතුවෙන් සියයට 20 ක් නියෝජනය කරමින් රු. මිලියන 179 ක විදේශ ණය ප්‍රතිපාදන සහ සියයට 20 ක් නියෝජනය කරමින් රු.මිලියන 15 ක ශ්‍රී ලංකා රජයේ අරමුදල් ව්‍යාපෘතිය විසින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | එකඟ වේ.<br><br>වැය විෂය අංක 117—4-32-2506(12) යටතේ 2023 වර්ෂයේදී ලබා දී ඇති ප්‍රතිපාදනය රු. මිලියන 900ක් වන අතර ඒ සඳහා මහරගම - පිළියන්දල මාර්ගයේ වියදම් ද ඇතුළත් වේ. උසාවි නඩුවක් හේතුවෙන් ව්‍යාපෘතිය තාවකාලිකව නතර කරන ලද අතර 117-2-4-32-2506(12) යටතේ ප්‍රමාණවත් අග්‍රිම නොලැබුණු අතර බෙදා හැරීමක් සිදු නොකරන ලදී. 117-2-4-32-2506(17) යටතේ රු.මිලියන 15ක් භාවිතා කළ නොහැකි විය. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කළ යුතුය. |